# මූල්‍ය ගිණුම්කරණය සහ වාර්තාකරණය

**[AA31]**

**02 වන පරිච්ඡේදය සඳහා වූ අතිරේකය**

# නෛතික රාමුව

# 2. නෛතික රාමුව (Regulatory Framework)

## 2.9 සංකලිත වාර්තාකරණය (Integrated Reporting/IR) හැඳින්වීම

### 1. සංකලිත වාර්තාකරණය යනු?

සංකලිත වාර්තාකරණය ආයතනයන්ට ව්‍යාපාරික වටිනාකම් / සාරධර්ම හා තිරසාරත්වය ඇති කිරීමේ ක්‍රියාවලියක් ලෙස බහුල වශයෙන් හඳුනාගෙන තිබේ. එය ආයතන තම ක්‍රියාකාරකම් පිළිබඳව සිතන, සැලසුම් කරන හා වාර්තා කරන ආකාරයට බලපායි.

**ආකෘතිමය රාමුව අනුව,**

සංකලිත වාර්තාකරණය : වටිනාකම් නිර්මාණය කිරීමේ අංශයන් සම්බන්ධයෙන් කාලයක් තිස්සේ ආයතනයක් විසින් වටිනාකම් නිර්මාණය කිරීම් සහ ඒ සම්බන්ධිත සන්නිවේදන කාලච්ඡේදයේ සංකලිත වාර්තාවකින් ප්‍රතිඵල දෙන, සංකලිත සිතීම මත සොයාගත් ක්‍රියාවලියක් වේ.

**සංකලිත වාර්තාකරණයේ ප්‍රධාන අරමුණු (Key Objectives of Integrated reporting)**

- වඩා කාර්යක්ෂම සහ සඵලදායී ලෙස ප්‍රාග්ධනය වෙන් කිරීම සඳහා මූල්‍ය ප්‍රාග්ධනය සපයන්නන් හට ලබාගත හැකි තොරතුරුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- විවිධ වාර්තාකරණ ප්‍රමිත ඇතිකරන හා කාලයක් සමඟ වටිනාකම් නිර්මාණය කිරීමේ ආයතනයක් සතු හැකියාවට බලපාන ප්‍රමාණාත්මක සියලු ආකාරයේ සාධක සන්නිවේදනය කරන සාංගමික වාර්තාකරණයට වඩා හොඳින් එකිනෙකට සම්බන්ධ වූ කාර්යක්ෂම ප්‍රවේශයක් ලබා දීම.
- ප්‍රාග්ධනවල බහුවිධ ප්‍රවේශය සඳහා (මූල්‍ය, නිෂ්පාදිත, ස්වභාවික සහ මානව ප්‍රාග්ධනය යනාදී) වගවීම සහ නියෝජ්‍යත්වභාවය (භාරකාරත්වය) වැඩිදියුණු වීම සහ ඔවුන් අතර අන්‍යෝන්‍ය රැඳියාව පිළිබඳව අවබෝධයක් ලබාදීම ප්‍රවර්ධනය කිරීම
- කොටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් වටිනාකම් නිර්මාණය කිරීමට අවධානය යොමුකරන ඒකාබද්ධ සිතුවිලි, තීරණ ගැනීම සහ ක්‍රියාකාරකම් සඳහා සහය වීම.

### 2. සංකලිත වාර්තාවක් (Integrated Report (IR)) යනු කුමක් ද?

ජාත්‍යන්තර සංකලිත වාර්තාකරණ රාමුවෙහි සඳහන් ආකාරයට සංකලිත වාර්තාවක් යනු, බාහිර පරිසරය තුළ ආයතනයක් විසින් තම උපායමාර්ග, පාලනය, කාර්යසාධනය හා අපේක්ෂා, කොටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් වටිනාකම් නිර්මාණය කිරීමට දායකත්වය දක්වන්නේ කෙසේද යන්න පෙන්වන සංක්ෂිප්ත සන්නිවේදනයකි.

ආයතනයකට වටිනාකම් නිර්මාණය කිරීමේ උපාය මාර්ගයට විවිධාකාර ප්‍රාග්ධනයන් දායකත්වය දක්වන්නේ කෙසේදැයි සංකලිත වාර්තාවක් මඟින් පැහැදිලි කරයි. එමනිසා සාම්ප්‍රදායික මූල්‍ය ප්‍රාග්ධනයෙන් ඔබ්බට ප්‍රාග්ධනය පිළිබඳව පුළුල්ව පැහැදිලි කිරීම සංකලිත වාර්තාකරණය මගින් සිදුවෙයි. එය ස්වාභාවික ප්‍රාග්ධනය, සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, නිෂ්පාදිත ප්‍රාග්ධනය හා මූල්‍ය ප්‍රාග්ධනය ලෙස අඩංගු වන ප්‍රාග්ධනය පිළිබඳ බහුවිධ ප්‍රවේශය ලෙස හඳුනාගත හැකිය.

**ජාත්‍යන්තර සංකලිත වාර්තාකරණ කවුන්සිලය (International Integrated Reporting Council (IIRC))**

ජාත්‍යන්තර සංකලිත වාර්තාකරණ කවුන්සිලය යනු, නියාමකයින්, ආයෝජකයින්, සමාගම්, ප්‍රමිත සම්මතකරන්නන්, ගණකාධිකරණ වෘත්තිකයන් සහ රාජ්‍ය නොවන සංවිධානවල ගෝලීය එකතුවකි. මෙම එකමුතුව සාංගමික වාර්තාකරණ විකාශයේ ඊළඟ පියවර ලෙස වටිනාකම් නිර්මාණය කිරීම පිළිබඳ සන්නිවේදනය ප්‍රවර්ධනය කරයි.

## 3. සංකලිත වාර්තාවේ අරමුණ (Purpose of the Integrated Report)

සංකලිත වාර්තාවක ප්‍රධාන අරමුණ වන්නේ මූල්‍ය ප්‍රාග්ධනය සපයන්නන් හට කාලයක් තිස්සේ වටිනාකම් නිර්මාණය කරන ආකාරය පැහැදිලි කිරීමයි. එමනිසා එය ආයතනයක කාලයත් සමඟ වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාව සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන්, දේශීය ප්‍රජාවන්, නීති සම්පාදකයින්, නියාමකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු සියලුම ආයතනයට ඇල්මක් ඇති පාර්ශවයන්ට ප්‍රයෝජනවත් වෙයි.



## 4. සංකලිත වාර්තාවක ප්‍රධාන සංරචක (Key Components of an Integrated Report)

සංකලිත වාර්තාවක් මූලික වශයෙන් එකිනෙකට සම්බන්ධ වන්නා වූ කරුණු අටක (08) අන්තර්ගතයකි. නමුත් මෙකී සංරචක අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර නොවේ.

**1. ව්‍යාපාරික ආකෘතිය**

**<u>ප්‍රධාන ක්ෂේත්‍ර (Key areas)</u>**

- ව්‍යාපාර සංවිධානයේ දැක්ම සහ මෙහෙවර
- සංවිධාන ව්‍යුහය, ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ ක්‍රියාවලීන්
- ව්‍යාපාරයේ මූලික යෙදවුම් සහ ඒ මත ඇතිවන නිමවුම් සහ ප්‍රතිඵල (outcomes)
- උපායක්‍රමික අරමුණු, ප්‍රධාන අවදානම් සහ අවස්ථා
- සියලු සය විධ ප්‍රාග්ධනය

ව්‍යාපාර ආයතනවල ඛණ්ඩ අනුව ව්‍යාපාර ආකෘති සැලකිය යුතු වෙනසක් දක්වන බැවින්, වෙන්ව ඉදිරිපත් කිරීම වැදගත් වේ.

**02. සංවිධානමය විශ්ලේෂණය හා බාහිර පරිසරය**

**<u>ප්‍රධාන ක්ෂේත්‍ර (Key areas)</u>**

<u>සංවිධානමය විශ්ලේෂණය</u>

- හිමිකාරිත්වය සහ මෙහෙයුම් ව්‍යුහය
- ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වෙළෙඳපොලවල්
- වෙළෙඳපොළ ස්ථානගත කිරීම
- මූලික ප්‍රමාණාත්මක තොරතුරු (උදා: පිරිවැටුම, සේවක සංඛ්‍යාව)

<u>බාහිර පරිසරය</u>

- ප්‍රධාන ඇල්මැති පාර්ශ්වයන්ගේ නෛතික අවශ්‍යතා සහ ඇල්ම
- සාර්ව සහ සූක්ෂම ආර්ථික තත්ත්වයන්
- වෙළෙඳපොළ බලවේග (තරගකරුවන්ගේ සහ පාරිභෝගික ඉල්ලුමේ ශක්තීන් සහ දුර්වලතා)
- තාක්ෂණික වෙනස්වීම්වල බලපෑම්
- පාරිසරික අභියෝග
- සංවිධානය ක්‍රියාත්මක වන්නා වූ ව්‍යවස්ථාදායක සහ නියාමන පරිසරය
- රට තුළ දේශපාලන පරිසරය

**03. ප්‍රාග්ධන කළමනාකරණය**

**<u>ප්‍රධාන ක්ෂේත්‍ර (Key areas)</u>**

- ඉලක්ක, අවදානම් සහ අවස්ථාවන් සම්බන්ධ ප්‍රමාණාත්මක දර්ශක
- ව්‍යාපාරික බලපෑම්වල ධනාත්මක සහ ඍණාත්මක භාවයන්
- අතීත සහ වර්තමාන කාර්යසාධනය අතර සහ වර්තමාන කාර්යසාධනය සහ සංවිධානය පිටතට දිස්වන ආකාරය අතර ඇති සම්බන්ධතාවන්
- කාර්යසාධනය දක්වන්නා වූ ප්‍රධාන දර්ශක (Key performance indicators (KPIs))
- නීතිරීති මගින් කාර්යසාධනය මත ඇතිවන්නා වූ වැදගත් ප්‍රතිඵල දක්වනා වූ සුවිශේෂී අවස්ථා

**04. ඇල්මැති පාර්ශ්වයන්ගේ සබඳතා**

**<u>ප්‍රධාන ක්ෂේත්‍ර (Key areas)</u>**

- ආයතනය මගින් එහි ඇල්මැති පාර්ශ්වයන් හඳුනාගෙන ඇති ආකාරය
- ඇල්මැති පාර්ශ්වයන් හා සම්බන්ධ වීමේ ක්‍රමවේදය
- ඇල්මැති පාර්ශ්වයන්ගේ ප්‍රමාණාත්මක ගැටළු හඳුනාගැනීම
- ආයතනයෙහි ව්‍යාපාරික ආකෘතියට අදාළව එහි ප්‍රතිඵල, සබඳතා සහ පිටත දර්ශනය තක්සේරු කිරීමට ඇල්මැති පාර්ශ්වයන් දායකවන ආකාරය

**05. උපාය මාර්ග සහ සම්පත් වෙන් කිරීම**

**<u>ප්‍රධාන ක්ෂේත්‍ර (Key areas)</u>**

- ආයතනයෙහි කෙටිකාලීන, මධ්‍යකාලීන උපාය මාර්ගික අරමුණු
- පුළුල් වෙළෙඳපොළෙහි ව්‍යාපාරය ස්ථානගත වී ඇති ආකාරය
- දීර්ඝකාලීන උපායමාර්ග වර්තමාන ව්‍යාපාරික ආකෘතියට අදාළ වන ආකාරය
- සම්පත් වෙන්කිරීමේ සැලසුම
- කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන වශයෙන් අපේක්ෂාවන් මනින ආකාරය සහ ව්‍යාපාර ඉලක්කයන්ගේ ප්‍රතිඵල හඳුනාගැනීම
- උපායමාර්ගික ඉලක්කයන්ට එරෙහි කාර්යසාධනය

**06. පිටත දර්ශනය**

**<u>ප්‍රධාන ක්ෂේත්‍ර (Key areas)</u>**

- බාහිර පරිසරය සම්බන්ධයෙන් ආයතනයෙහි අපේක්ෂාවන්
- එය ආයතනයට බලපානු ලබන්නේ කෙසේ ද යන්න
- පැනනැගිය හැකි අවිනිශ්චිතතා සහ තීරණාත්මක / ඉතා වැදගත් අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීමට ආයතනය වර්තමානයෙහි සූදානම් වී ඇති ආකාරය

**07. පාලනය**

**<u>ප්‍රධාන ක්ෂේත්‍ර (Key areas)</u>**

- ආයතනයේ නායකත්ව ව්‍යුහය
- ආයතනයක් විසින් අනුගමනය කරනු ලබන්නා වූ සාංගමික යහපාලනය පිළිබඳ අනිවාර්ය සහ ස්වේච්ඡා නීති සංග්‍රහය.
- ආයතනය විසින් ක්‍රියාත්මක කරන්නා වූ සදාචාරාත්මක නීති පද්ධතිය
- උපායමාර්ගික තීරණ ගැනීමට සහ සාංගමික යහපාලන නීති සංග්‍රහය හා අනුගත කිරීමට සහ අධීක්ෂණය කිරීමට යොදා ගනු ලබන්නා වූ විශේෂිත ක්‍රියාවලීන්

**08. ආවදානම් කළමනාකරණය සහ අභයන්තර පාලනය**

**<u>ප්‍රධාන ක්ෂේත්‍ර (Key areas)</u>**

- අවදානම් සහ අවස්ථාවන් සම්බන්ධ නිශ්චිත මූලාශ්‍රය
- පැන නැඟිය හැකි අවදානම් සහ අවස්ථා පිළිබඳ ආයතනයෙහි තක්සේරුව
- ප්‍රධාන අවදානම් අවම කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා අනුගමනය කරනු ලබන්නා වූ විශේෂිත පියවර
- අභ්‍යන්තර පාලනයන්හි සඵලදායීතාවය සහ ඇල්මැති පාර්ශ්වයන්ගේ අවශ්‍යතා සුරක්ෂිත කිරීමට සහ අභ්‍යන්තර පාලනයන් අනාවරණය කිරීමට මණ්ඩලයෙහි වගකීම වාර්තා කිරීම.

## 2.10 තිරසාරත්ව වාර්තාකරණය (Sustainability Reporting) හැඳින්වීම

තිරසාර වාර්තාකරණය ත්‍රිත්වමය වාර්තාකරණය, ආයතනික සමාජ වගකීම් (Corporate Social Responsibility) වාර්තා කිරීම සහ තවත් බොහෝ දේ මූල්‍ය නොවන වාර්තා සඳහා වෙනත් නියමයන් සමඟ සමාලෝචනය කළ හැකිය. එය සංකලිත වාර්තාකරණයේ අනිවාර්ය අංගයකි. මූල්‍යමය සහ මූල්‍යමය නොවන ක්‍රියාකාරිත්වයන් විශ්ලේෂණය කිරීම වඩාත් මෑත වර්ධනයකි.

### 1. තිරසාරත්ව වාර්තාවක් (sustainability report) යනු කුමක් ද?

තිරසාරත්ව වාර්තාවක් යනු, ආයතනයක් හෝ සමාගමක් විසින් එහි එදිනෙදා ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන ආර්ථික, පාරිසරික සහ සමාජ බලපෑම් පිළිබඳ ප්‍රකාශයට පත් කරන වාර්තාවකි. එමගින් ආයතනයෙහි වටිනාකම් හා පාලන ආකෘතිය ඉදිරිපත් කරන අතර තිරසාර ගෝලීය ආර්ථිකයක් උදෙසා එහි උපාය මාර්ග සහ කැපවීම් පෙන්නුම් කෙරේ.

තිරසාර වාර්තාවක් තුළින් ආයතනයෙහි තිරසාර කාර්යසාධනය පිළිබඳ සමබර සහ සාධාරණ ඉදිරිපත් කිරීමක් කළ යුතු අතර ධනාත්මක සහ සෘණාත්මක දායකත්වයන්ද ඊට ඇතුළත් විය යුතුය.

මෙමගින් එම ආයතනවල තමන්ගේ ආර්ථික, පාරිසරික, සමාජීය සහ පාලන කාර්යසාධනය මැන බැලීමට සහ සන්නිවේදනය කිරීමට සහාය වන අතර ඉලක්ක ඇතිකර ගැනීමට ද එමගින් වඩා ඵලදායී ලෙස වෙනස්කම් කළමනාකරණය කර ගැනීමට ද සහාය වෙයි.

එමනිසා තිරසාරත්ව වාර්තාවක් යනු, ආර්ථික, පාරිසරික, සමාජීය සහ පාලන ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු සපයන ආයතනික වාර්තාවකි.

## 2. තිරසාරත්ව වාර්තාවේ අරමුණ (Purpose of the Sustainability Report)

තිරසාර වාර්තාවේ ප්‍රධාන අරමුණ ආයතනයෙහි අතීත කාර්යසාධනය පිළිබඳව සහ පාරිසරික, සමාජීය සහ යහපාලනය පිළිබඳ අනාගත දැක්ම සම්බන්ධ විස්තර ඇල්මැති පාර්ශ්වයන් වෙත සැපයීමයි.

සංකලිත වාර්තාකරණයේ ආරම්භය සමඟ, තිරසාරත්ව වාර්තාවක විශේෂ අරමුණ සංකලිත වාර්තාකරණ ක්‍රියාවලිය මඟින් තීරණය කළ යුතුය.

පහත සඳහන් අරමුණු සඳහා ද තිරසාරත්ව වාර්තා භාවිත කළ හැකිය.

1. නීති, සම්මතයන්, සංග්‍රහ, කාර්යසාධන ප්‍රමිතීන් සහ ස්වේච්ඡා මූලපිරීම් සම්බන්ධයෙන් තිරසාර කාර්යසාධනය මිණුම් ලකුණු කිරීම් සහ ඇගයීම් කිරීම.
2. සංවිධානයක් විසින් තිරසාර සංවර්ධනය පිළිබඳව අපේක්ෂාවන්ට බලපෑම් කරන සහ එම අපේක්ෂාවන්ගෙන් බලපෑමට ලක්වන ආකාරය නිරූපණය කිරීම.
3. කාලයත් සමඟ විවිධ සංවිධාන අතර සහ සංවිධානයක් ඇතුළත කාර්යසාධනය සැසඳීම.